මාධ්‍ය නිවේදන - අංක 27

මැතිවරණ කොමිෂන් සභාව

## පාර්ලිමේන්තු මහ මැතිවරණය - 2020

## තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින වකවානු සහ මැතිවරණ ක්‍රියාවලියට අදාළ දින නියම කිරීම

2020 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව තැපැල් ඡන්ද සලකුණු කිරීමට අදාළ දින වකවානු මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති බව හා එම දින පිළිබඳව නිල දැනුම්දීමක් සිදු කර ඇති බවට සම්ප්‍රදායික හා නව මාධ්‍ය හරහා ප්‍රචාරය වූ ප්‍රවෘත්තිය සම්පූර්ණයෙන්ම අසත්‍යයක් බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම මැතිවරණයට අදාළ කාර්යයන් සිදු කිරීමේ දින නියම කිරීමට අදාළ කිසිදු මැතිවරණ කොමිෂන් සභා පත්‍රිකාවක්, මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත්ව නොමැති අතර එවැන්නක් සකස් කර හෝ නොමැති බව විෂයභාර නිලධාරීන් සහ මැතිවරණ කොමසාරිස් ජනරාල් මා වෙත දන්වා තිබේ.

එහෙයින් මාගේ හෝ නිසි ලෙස බලය පැවරූ නිලධරයකුගේ මාධ්‍ය නිවේදනයකින් සනාථ කෙරෙන තුරු මෙවැනි දින නියම කිරීම් පිළිබඳව ප්‍රසිද්ධ කිරීම් සිදු නොකරන ලෙස සියලුම ජනමාධ්‍ය ආයතන හා ජනමාධ්‍යවේදීන්ගෙන් මැතිවරණ කොමිෂන් සභාව කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති,මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

2020.06.12